## 435 ජේසු රජාණෝ

ජේසු රජාණෝ ලෝ මිදුවාණෝ
ගෝසැලැ ජනිත වුණෝ
ලෝ ගැලවීම නිසාය එතුමෝ
මනු ලොව පහළ වුණෝ

බෙත්ලෙහෙමේ පොඩි ගව ඔරුවේ
තණ මත වැතිරී සීතලයේ
දෙව් බිළිඳා සැතපේ උඩුකුරුවේ
යව් වඳිනට මෙ රැයේ

සුර ලොවැ දෙවිඳුට මහිමය වේ
නර ලොවැ සතුනට සාමය වේ
යන සුර ගී නද රැ කඳුකරයේ
රැව් පිළි රැව් දුන්නේ

සුර දුතු සැරසුණු සුදු වතිනා
බැටළු එඬේරුන් හට පෙණුනා
මනුකය ගෙන ආ වචනය තෙමගේ
උපත දැනුම් දුන්නා

දෙව් බිළිඳා පුනවා ඔරුවේ
මරිය ජුසේ දෙදෙනා දෙපසේ
සිටියා රුව දැක බොළඳ සිනාවේ
ගිලෙමින තුටු සයුරේ